# ජාතික විමසුම් මධ්‍යස්ථානය

## (WTO/TBT inquiry Point)

භාණ්ඩ හා සේවා තත්ත්වයේ උසස් බව පෙන්නුම් කිරීමට අවශ්‍ය වඩාත් සුදුසු අවම අවශ්‍යතා රටින් රටට වෙනස් වන බැවින් තාක්ෂණික රෙගුලාසි සහ ජාතික ප්‍රමිති විවිධාකාර වේ.

මෙවැනි වෙනස්කම් වෙළෙඳ කටයුතු සඳහා බාධක ලෙස සැලකෙන බැවින් WTO/TBT එකඟතා ගිවිසුම මගින් මෙම බාධක අවම කර ගැනීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා ඉදිරිපත් කර ඇත. සෑම රටක් විසින්ම පනවනු ලබන තාක්ෂණික රෙගුලාසි අන්තර්ජාතික වෙළෙඳ මධ්‍යස්ථානය (WTO) වෙබ් අඩවියේ අඩංගු කර ඇත.

ශ්‍රී ලංකාවේ පනවනු ලබන තාක්ෂණික රෙගුලාසි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය වෙත දැනුම් දුන් විට, එම තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ඕනෑම අයෙකුට ලබා ගත හැක. මෙහිදී යම්කිසි ප්‍රකාශනයක් වෙනත් රටකින් ඉල්ලුම් කළ විට ප්‍රමිති ආයතනය මගින් ඉල්ලුම්කරු වෙත ලබා දෙයි.

වසරක් පාසා සම්පාදනය කිරීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා ප්‍රමිති වල ලැයිස්තුවක් ද ප්‍රමිති ආයතන වෙබ් අඩවියේ අන්තර්ගත කර ඇත.

වෙනත් රටවල තාක්ෂණික රෙගුලාසි අන්තර්ජාලය තුලින් ලබාගෙන ඒවා ප්‍රමිති ආයතනයේ වෙබ් අඩවියේ අඩංගු කිරීම සහ එම රෙගුලාසි වානිජ මණ්ඩල හරහා දේශීය නිෂ්පාදකයන් වෙත ලබා දීමද ජාතික විමසුම් මධ්‍යස්ථානයෙන් සිදුකෙරෙන තවත් කාර්යයකි.

WTO වෙබ් අඩවිය http://www.wto.org වෙත පිවිසීමෙන් මේ සම්බන්ධ විස්තර ලබා ගත හැක.